සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය
## ඉතිහාසය

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය දෙකයි.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. අනුරාධපුර නගරයේ අවශ්‍යතාව සඳහා තිසා වැව කරවන ලද පාලකයා වූයේ,

(1) පණ්ඩුකාභය (2) වසභ
(3) මහසෙන් (4) දේවානම්පියතිස්ස

02. ක්‍රි.ව. 1215 වර්ෂයේ දී රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට බලපෑ ප්‍රධානතම හේතුව ලෙස සැලකෙන්නේ,

(1) මැලේරියා රෝගය පැතිර යාම යි.
(2) නියං කාලයක් පැමිණීම නිසා වැව් අමුණු සිඳීයාම යි.
(3) කාලිංග මාඝගේ ආක්‍රමණය යි.
(4) චෝල ආක්‍රමණ නිසා සිදු වූ විනාශය යි.

03. වැවක ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනීම සඳහා කරන ලද නිර්මාණය කුමක් ද?

(1) ඇතුළුවාන (2) බිසෝකොටුව
(3) සොරොව්ව (4) පිටවාන

04. පහත 'අ' තීරුව සමඟ 'ආ' තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| (1) ඇළහැර ඇළ | A. මහසෙන් රජතුමා |
| (2) තල්වතු ඇළ | B. වසභ රජතුමා |
| (3) යෝධ ඇළ | C. I අග්බෝධි රජතුමා |
| (4) මිනිපේ ඇළ | D. ධාතුසේන රජතුමා |

(1) ABDC (2) BADC
(3) CDBA (4) DABC

05. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට උයනක් තනවන ලද රජු ලෙස සැලකෙන්නේ,

(1) මුටසිව

(2) දේවානම්පියතිස්ස

(3) I වන කාශ්‍යප

(4) කුටකණ්ණ තිස්ස

I 06 වන ප්‍රශ්නයේ සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

06. තිසා වැව ඉවුරෙහි ඉසුරුමුණි විහාරයේ සිට මිරිසවැටි විහාර භූමිය දක්වා ප්‍රදේශය ................................................................ උයනට අයත් වේ. (මහමෙවුනා/ රන්මසු)

07. මෙරට මිනිස් ප්‍රජාවේ ආදිතමයන් මුලින්ම ඉගෙන ගත් දැතේ කර්මාන්ත අතර ................................................................ කර්මාන්තයට ප්‍රධාන තැනක් හිමිවේ. (මැටි/ යකඩ)

08. අතීතයේ සීගිරියේ අලකොළවැව දෙහිගහ ඇළකන්ද ප්‍රදේශයේ යකඩ නිස්සාරණය සඳහා .................................................... භාවිත කර ඇත. (ස්වභාවික සුළං/ මයිනහමක්)

09. පොළොන්නරුවේ ඇතුළු නුවර පිහිටි වෛජයන්ත ප්‍රාසාදය නම් වූ මහල් හතක් වූ ගොඩනැගිල්ල .................................... රජුගේ නිර්මාණයකි. (නිශ්ශංකමල්ල/ මහා පරාක්‍රමබාහු)

10. මාතර වැලිගම නගරය ආසන්නයේ පිහිටි කුෂ්ටරාජ ගලේ නෙලා ඇති ප්‍රතිමාව, ................................................................ පිළිමයකි. (බුද්ධ/ බෝධිසත්ත්ව)

I 11 වන ප්‍රශ්නයේ සිට 15 තෙක් දී ඇති ප්‍රකාශ කියවා නිවැරදි නම් (3) ලකුණ ද, වැරදි නම් (5) ලකුණ ද ඉදිරියේ ඇති වරහන මත ලකුණු කරන්න.

11. පොළොන්නරු යුගයේ සඳකඩ පහණේ විශේෂ ලක්ෂණයක් වන්නේ ගව රූපය ඉවත් කිරීමයි. (      )

12. දිවයිනේ මෙතෙක් සොයාගෙන ඇති වාස්තු විද්‍යා නිර්මාණ බොහොමයක් දේවානම්පියතිස්ස රාජ්‍ය සමයට පෙර නිර්මාණය වූ ඒවා වේ. (      )

13. පොළොන්නරු යුගයට අයත් කලාත්මක බෝධිඝරය වන්නේ නිල්ලක්කගම බෝධිඝරයයි. (      )

14. උඩරට, කෝට්ටේ රාජ්‍යයෙන් නිදහස් කර ගැනීමට 6 වන පරාක්‍රමබාහු රජුට එරෙහිව කැරැල්ලක් ඇති කළේ ජෝතිය සිටුවරයා ය. (      )

15. 1505 දී ලංකාවට පැමිණි පෘතුගීසීන් මුලින් ම සම්බන්ධතා ඇති කරගත්තේ උඩරට රාජ්‍ය සමඟ ය. (      )

- **16 වන ප්‍රශ්නයේ සිට 20 තෙක් ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

16. ක්‍රි.ව. 1580 දී උඩරට රාජ්‍ය යටත් කරගැනීමට සීතාවක ................................................................ රජතුමාට හැකියාව ලැබුණි.

17. මහනුවර රාජධානියේ ................................................................ නැමැත්තා පළමුවන විමලධර්මසූරිය නමින් උඩරට රජ විය.

18. උඩරට රාජ්‍ය සමයේ දුම්බර ප්‍රදේශයේ ප්‍රසිද්ධ වූයේ ................................................................ කර්මාන්තය සඳහා ය.

19. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ ඉංග්‍රීසීන් අතට පත්වන විට උඩරට පාලකයා වූයේ ................................................................ රජුය.

20. පොළොවට ගල් කණු සිටුවා ඒ මත ලීයෙන් තනන ලද ගොඩනැගිලි ................................................................ විහාර නමින් හඳුන්වයි.

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**
- **ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01. (අ) (I) යාබද සිතියමේ දක්වා ඇති අක්ෂරවලට අදාළ නම් පහත ලැයිස්තුවෙන් තෝරා, සිතියමේ අදාළ අක්ෂරය ඉදිරියෙන් ලියන්න.

(i) ගාල්ල ....................

(ii) අනුරාධපුරය ....................

(iii) මහවැලි ගංගාව ....................

(iv) කෝට්ටේ ....................

(v) පොළොන්නරුව ....................

(vi) මාතර ....................




(ලකුණු 06)

(ආ) පහත රූපයේ දැක්වෙන්නේ අභයගිරි දාගැබට හා සලපතළ මළුවට වැටෙන ජලය පොකුණට ගලා යාමට සලස්වා ඇති ආකාරයයි. එහි A, B, C යනුවෙන් දක්වා ඇති කොටස් නම් කරන්න.




(ලකුණු 03)

(ඇ) (i) යාබඳ රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙම නිර්මාණය අයත් වන යුගය කුමක් ද?

(iii) මෙම චිත්‍රවල භාවිත කළ වර්ණ අතුරින් කැපී පෙනෙන වර්ණයක් සඳහන් කරන්න.



(ලකුණු 03)

(02) (i) පණ්ඩුකාභය රජතුමා විසින් ඉදිකරන ලද වැව් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) A - මහ වැව් තැනවීම හා සම්බන්ධ පාලකයන් දෙදෙනෙක් නම් කරන්න.

B - මහවැව් තැනීමේ දී ලාංකිකයන් ලැබූ ජයග්‍රහණ දෙකක් නම් කරන්න.

(ලකුණු 04)

(iii) වැව් බැම්ම නිර්මාණයේ දී පැරණි ලාංකිකයන් තාක්ෂණය යොදාගත් ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) ''ශ්‍රී ලංකාවේ පොකුණු තැනීම් පිළිබඳ ඉතිහාසය විජය පුරාවෘත්තය තරම් ඈතට දිවයයි.''

(i) පැරැන්නන් විසින් පොකුණු තැනීමෙන් අපේක්ෂා කළ අරමුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) ජල උද්‍යානවල කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පැරණි ශ්‍රී ලාංකිකයන් පොකුණු නිර්මාණයේ දී යොදා ගත් තාක්ෂණය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) A - කබර B - තඹර C - තොපෂ

යනුවෙන් සෙල්ලිපිවල සඳහන් වන්නේ කුමන කර්මාන්තකරුවන් ද යන්න පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 03)

(ii) a - අතීතයේ දී ගඩොල් බහුලව යොදාගත් ඉදිකිරීම් දෙකක්

b - අනුරාධපුර යුගයට අයත් අග නගරයෙන් බැහැරව ඉදිකරන ලද විශාල දාගැබ් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) රජරට ශිෂ්ටාචාර සමයේ මෙරටෙහි යකඩ, තඹ, රන්, රිදී ආදී ලෝහ භාවිත කර කර්මාන්ත පවත්වාගෙන ගිය බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිත කළ වෙනත් නම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) a - උඩරට රාජ්‍යයට ආරක්ෂාව ලැබුණු කඳුවැටි දෙකක්

b - උඩරට රාජ්‍යයට ආරක්ෂාව ලැබුණු දුර්ග මාර්ග දෙකක් බැගින් නම් කරන්න. (ලකුණු 04)

(iii) ''පළමුවන විමලධර්මසූරිය රජවීම උඩරට රාජ්‍ය ඉතිහාසයේ වැදගත් සිදුවීමකි.'' මෙතුමාගේ වැදගත්කම කරුණු දෙකකින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) පහත සඳහන් සිද්ධීන්ට අදාළ පාලකයන් හෝ පුද්ගලයන් පිළිවෙළින් නම් කරන්න.

A - පෘතුගීසීන් මෙරටින් පළවා හැරීමට සමත් වීම.

B - නායක්කාර් වංශික ආරම්භක පාලකයා

C - රන්දෙණිවෙල සටනින් පරාජයට පත් පෘතුගීසි සෙන්පතියා (ලකුණු 03)

(ii) මහනුවර රාජ්‍ය සමයේ චිත්‍ර කලාවේ දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මහනුවර රාජධානි සමයේ දී පැවති දේශීය හා විදේශීය වෙළෙඳාම සිදු වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)